ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම

2025 අගෝස්තු 27 වැනි දින රුපියල් මිලියන 82,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ වෙන්දේසිය

භාණ්ඩාගාර බිල්පත් නිකුතුව පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

පරිණත කාලය	දින 91	දින 182	දින 364	එකතුව
සු.හ.ජා. අංකය (ISIN)*	LKA09125K284	LKA18226B270	LKA36426H289	
වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ මුදල (රු.මිලි.)	15,000	32,000	35,000	82,000

වෙන්දේසි කරන දිනය	: 2025 අගෝස්තු 27 වැනි දින
ගෙවීම් කළ යුතු දිනය	: 2025 අගෝස්තු 29 වැනි දින
නිකුතුවේ දිනය	: 2025 අගෝස්තු 29 වැනි දින
ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාව	: 2025 අගෝස්තු 27 වැනි බදාදා පෙ.ව. 11.00
ලංසුවක් සඳහා අවම මුදල	: රුපියල් මිලියන පහක් (5,000,000/-) සහ ඉන් අනතුරුව රුපියල් මිලියනයේ (1,000,000/-) ගුණිතයන්ගෙනි.

රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලැබ ඇති විද්‍යුත් ලංසු ඉදිරිපත් කිරීමේ පහසුකම මගින් පමණකි. ඉහත සඳහන් පරිදි ලංසුවක් සඳහා වන අවම මුදලට අනුගත වෙමින් අපේක්ෂිත ආයෝජකයන්ට (මහජනතාව හෝ වෙනත් ඕනෑම ආයෝජකයෙකුට) පහත සඳහන් ප්‍රාථමික අලෙවිකරුවන් හරහා ලංසු ඉදිරිපත් කළ හැකිය.

ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ලැයිස්තුව

ලංකා බැංකුව	2541938	ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී.එල්.සී.	2639883
කැපිටල් එලයන්ස් පී.එල්.සී.	2317777	මහජන බැංකුව	2206783
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.	2332319	සම්පත් බෑන්ක් පී.එල්.සී.	2305842
එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්	2425010	සෙලාන් බෑන්ක් පී.එල්.සී.	2456340
එච්.එන්.බී සෙකියුරිටීස් ලිමිටඩ්	2206297	වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ්	2675096

වෙළෙඳපොල තත්ත්වයන් මත, මෙම වෙන්දේසියට ඉදිරිපත් කරන ලද සම්පූර්ණ ප්‍රමාණය ඉක්මවා නොයන පරිදි, එක් එක් පරිණත කාලයන්ට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රමාණයන්ට වඩා අඩු හෝ වැඩි ප්‍රමාණයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගනු ලැබිය හැකි ය.
අපේක්ෂිත ආයෝජකයන්ට ප්‍රාථමික අලෙවිකරුවන් හෝ අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා ද්විතියික වෙළෙඳපොළෙන්ද භාණ්ඩාගාර බිල්පත් මිලදී ගත හැකිය.

* සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය

නිකුත් කරන කාර්යාලය
රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
30, ජනාධිපති මාවත
කොළඹ 01.
දුරකථන :+94 11 2477011 ෆැක්ස් :+94 11 2477687
www.cbsl.gov.lk

එන්. ඩී. වයි. සී. වීරසිංහ
රාජ්‍ය ණය අධිකාරී/ලේඛකාධිකාරී